# අනගාරික ධර්මපාල ඃ සිංහල බෞද්ධ ජාතිකවාදය සඳහා ඉතිහාසය භාවිතය

**අනුෂිකා නිලානි එදිරිසිංහ**[1]

*[1]මාහින්කන්ද, දෙහිඹිවිට, ශ්‍රී ලංකාව.*

**eanushika@gmail.com*

මෙරට බ්‍රිතාන්‍ය යටත්විජිතවාදය සහ ක්‍රිස්තියානිකරණය දැඩිව ක්‍රියාත්මක වන පසුබිමක් තුළ උපත ලැබ, එහි ප්‍රතිඵලයක් ලෙස දොන් ඩේවිඩ් යන නම ලැබ, ඉංග්‍රීසි භාෂාව හා ක්‍රිස්තු ධර්මයෙන් යුත් පාසැල් අධ්‍යාපනයක් ලැබීමට සිදුවුවත්, කුඩා අවධියේ පටන් නිවසේදී දෙමාපියන්ගෙන් බෞද්ධාගමික හික්මීමක් ලැබූ ධර්මපාලට සිය තරුණ අවධියේදී කර්නල් ඕල්කට් සහ බ්ලැවැට්ස්කි මැතිනිය සමඟ පරම විඥානාර්ථ ව්‍යාපාරයේ කටයුතුවලට එක්වීමට අවස්ථාව ලැබුණි. වර්ෂ 1888 දී ඩේවිඩ් යන ක්‍රිස්තියානි නාමය අතහැර ධර්මපාල යන නමින් ඉදිරිපත් වන ඔහු යටත්විජිතවාදයට එරෙහි ප්‍රතික්‍රියාවක් වශයෙන් දහනව වන සියවස අග භාගයේදී ආරම්භ වන සංස්කෘතික පුනර්ජීවන ව්‍යාපාරයට ප්‍රබල නායකත්වයක් ලබා දුන්නේය. තම වර්ගයාගේ ප්‍රභවය හෙවත් එහි මුල් සොයා යාම දහනවවන සියවස වන විට යටත්විජිතවල ගොඩ නැගුණු ජාතිකවාදී ව්‍යාපාරයන්හි ප්‍රධාන ලක්ෂණයක් විය. විශේෂයෙන්ම ඉන්දියාවේ මෙන්ම ශ්‍රී ලංකාවේද ජාතිකත්වය ගොඩනැගීමේදී තම ජාතිකත්වයට ඉතා දීර්ඝ අතීතයක් තිබේය යන්න අවධාරණය කිරීම සඳහා ඓතිහාසික මූලාශ්‍රය සොයායාම, ඉතිහාස කරුණු භාවිතයට ගැනීම, එම කරුණු ඇසුරින් ඇතැම්විට අතීතය අතිශයෝක්තියට නඟා දැක්වීම පොදු ලක්ෂණයක් විය. සිංහල බෞද්ධ ජාතිකවාදී ව්‍යාපාරය වර්ධනය වෙද්දී අනගාරික ධර්මපාල විසින්ද ජාතික අනන්‍යතාවය වර්ධනය කිරීම සඳහා සිංහල භාෂාවේ හා බෞද්ධාගමේ මෙන්ම සිංහල සිරිත්විරිත්වල අතීතය මතු කිරීමත්, ජාත්‍යනුරාගය, ජාති හිතෛෂීත්වය වර්ධනය කිරීම සඳහා එය ශ්‍රේෂ්ඨ අතීතයක් බව දැඩිව අවධාරණය කිරීමත් දක්නට ලැබේ. ඔහුට අවශ්‍ය වූයේ යටත්විජිතකරණයට පෙර මෙරට ශ්‍රේෂ්ඨ සංස්කෘතියක් පැවති බව බ්‍රිතාන්‍යයන්ට මෙන්ම බටහිරකරණයට ශීඝ්‍රයෙන් ගොදුරු වෙමින් සිටි දේශීය ප්‍රභූ පැලැන්තියට ඒත්තු ගැන්වීමටත් එම අදහස සමාජය තුළ තහවුරු කිරීමටත් ය. තත්කාලීන ප්‍රවණතාවට අනුව සිංහල බෞද්ධ ජාතිකවාදය ගොඩනැංවීම සඳහා අනගාරික ධර්මපාල විසින් ඉතිහාස කරුණු භාවිතය විමසීමට ලක්කෙරෙන මෙම පර්යේෂණයේදී ඔහු විසින් රචිත විවිධ ලේඛන මෙන්ම සමකාලීන පුවත්පත් සඟරා ඇතුළු ප්‍රාථමික මූලාශ්‍ර විශ්ලේෂණාත්මක අධ්‍යයනයකට බඳුන් කෙරේ.

මුඛ්‍ය පද ඃ යටත්විජිතවාදය, ජාතිකවාදී, ඓතිහාසික මූලාශ්‍රය, ජාති හිතෛෂීත්වය,
ඓතිහාසික